## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදල - 2015

---

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1** **මතය**

**-------**

මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**------------------------------------------**

**2.2.1** **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**---------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේ දී පාලක සභාවේ අනුමැතියකින් තොරව මුහුණත අගය රු.19,914,851ක් වූ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සඳහා රු. 18,747,379 ක් ආයෝජනය කර තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.7,793,718 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.8,862,941ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම රු.1,069,223 ක් විය. මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම සඳහා භාණ්ඩාගාර බිල්පත් මත වූ පොලී ආදායම ඉකුත් වර්ෂයට වඩා රු.1,069,998 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

**4.1** **කාර්යසාධනය**

**----------------**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ප්‍රතිලාභ සැලසීමට අර්ථ සාධක අරමුදල් පිළිබඳ පාලනය, පරිශීලනය හා කළමනාකරණය සඳහා 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත යටතේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලීය අර්ථසාධක අරමුදල පිහිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී අරමුදල විසින් දායක ගිණුම්වලට බැර කරන ලද පොලිය රු.7,798,968ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු.8,866,549 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද ප්‍රතිලාභ ප්‍රමාණය සියයට 12 ක පිරිහීමක් පවතින බව නිරීක්ෂණය විය. ගෙවන ලද ප්‍රතිලාභය අරමුදලේ ආයෝජන ආදායම මත තීරණය වන අතර ඒ අනුව වර්ෂයෙන් වර්ෂයට එය විචලනය වී තිබුණි.

**4.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් අර්ථසාධක අරමුදල සඳහා පවත්වාගෙන යන ජංගම ගිණුමේ දෛනික ශේෂය සැලකිල්ලට නොගෙන චෙක්පත් නිකුත් කිරීම හේතුවෙන් වර්ෂ අවසාන බැංකු ශේෂය රු. 224,778ක සෘණ අගයක් ගෙන තිබුණි.

(ආ) අර්ථසාධක අරමුදලේ පරිපාලනය හා කළමනාකරණය සඳහා නියෝග සෑදීමේ බලය 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 27 වගන්තිය ප්‍රකාරව

විශ්වවිද්‍යාලයේ පාලක සභාවට පවරා ඇති අතර, ඒ අනුව සේවකයන්ට සිය දායක ගිණුමේ ශේෂයෙන් සියයට 60 ක් වසර 10 ක ආපසු ගෙවීමේ කාලයක් සඳහා පොලී රහිතව ණයට දීම සඳහා වූ නියෝගයක් සකස් කරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 37,544,904 ක් සේවකයින් 78 දෙනෙකුට සේවක ණය ලබා දී තිබුණු අතර ඒ සඳහා කිසිදු පොලියක් අය නොකිරීම හේතුවෙන් අරමුදලේ වර්ධනයට එය අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමු කරන ලද අතර, පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍රය** | **නිරීක්ෂණ** |
| --- | --- |
| (අ) ආයෝජනය | - පවතින ආයෝජන ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කර නොගැනීම සහ වඩා වාසිදායක නව ආයෝජන ක්‍රමවලට යොමු නොවීම |
| (ආ) සේවක ණය | - සේවක ණය සීමා නොකිරීම මත අරමුදලේ වර්ධනයට බලපෑම් සිදුවීම. |